# බ්‍රාහ්මණ සංයුක්තයෙන් විවරිත සමකාලීන ආගමික පසුබිම පිළිබඳ විමර්ශනයක්

දිවුලපැලැස්සේ විමලානන්ද හිමි

## ප්‍රවේශය

සංයුක්ත නිකායේ සගාථක වග්ගයෙහි ඇතුළත් බ්‍රාහ්මණ සංයුක්තය වනාහි බුද්ධකාලීන භාරතීය සමාජයේ විවිධ මතධාරී බ්‍රාහ්මණයන් බුදුරදුන් හමුවට පැමිණ නොයෙක් වාද විවාද, සාකච්ඡා සිදුකළ ආකාරය පිළිබඳ ඉගැන්වෙන ප්‍රමාණවත් ධර්ම කරුණු සංග්‍රහයකි. එකල සමාජ පසුබිමට අනුව බ්‍රාහ්මණයින් වේද ශාස්ත්‍රය අධ්‍යයනය සිදුකිරීම තහවුරු වූ ධර්මතාවක් වූ බැවින් බ්‍රාහ්මණ සමාජය බුද්ධි ප්‍රබෝධයේ උච්චතම ස්ථානයක පැවැති බව පිළිගත යුතුය. ත්‍රිපිටක සූත්‍රයන්හි සඳහන් ආකාරයට බුද්ධිමත් බ්‍රාහ්මණයා ත්‍රිවේදයෙහි පාරප්‍රාප්තයෙකි. ඔහු නක්ෂත්‍ර, ජ්‍යෝතිෂ්‍ය, ශික්ෂා, කල්ප, ව්‍යාකරණ, නිරුක්ති, නිඝණ්ඩු සහ කාව්‍ය ශාස්ත්‍රාදියෙහි ද නිපුණයෙකි. වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යක සහ උපනිෂද් යන යුග ඔස්සේ බ්‍රාහ්මණ සමාජය පෘථුල ඥාන විෂය ධාරාවක නිමග්නව සිටි ඥානගවේෂී අවදියක බෞද්ධ දර්ශනය ලොව පහළ වේ. බුද්ධිගවේෂී සමාජ පසුබිමක සිට බුදුරදුන් හමුවට පැමිණෙන බොහෝ බ්‍රාහ්මණයින් මහා වියත් පඬිවරු වූහ, මහාදාර්ශනිකයෝ වූහ, මහා විශාරදයෝ වූහ. පසුකාලීනව බුද්ධ ශාසනයට බුද්ධ ශ්‍රාවකයින් වශයෙන් එක් වූ බොහෝ බ්‍රාහ්මණ පඬිවරුන්ගෙන් ඒ බව පසක් වේ. මේ අතර ඇතැම් බමුණෝ බුදුරදුන්ට ආක්‍රෝශ පරිභව කරමින් බුදුරදුන් හමුවට පැමිණියහ. එහෙත් අවසානයේ ඒ සියල්ලෝම බුද්ධ ශ්‍රාවකයෝ බවට පත්වනුයේ බුදුරදුන්ගේ අපරිමිත ඥාන ශක්තියේත් තාදී ගුණයේත් ඔවුන් වෙත දැක්වූ බුද්ධි ගෝචර ආකල්පයේත් ප්‍රතිඵලයක් නිසාය. බ්‍රාහ්මණ සංයුක්තය වූ කලී මෙබඳු කථා ප්‍රවෘත්තීන්ගෙන් සංගෘහිත ධර්ම කොට්ඨාසයකි.



## බ්‍රාහ්මණ සංයුක්තයෙහි අන්තර්ගතය

සංයුක්ත නිකාය සගාථාවග්ග, නිදානවග්ග, ඛන්ධකවග්ග, සළායතන වග්ග සහ මහාවග්ග යනුවෙන් වග්ග පසෙකින් යුක්ත වේ. ඒ ඒ වග්ගයන්ට අයත් සංයුක්ත 64 ක් වන අතර ඒවායෙහි අන්තර්ගත වර්ග 228 කි. අටුවා විග්‍රහයන්ට අනුව ඒ සියල්ලට ඇතුළත් සූත්‍ර ගණනින් 7762 ක් බව සඳහන් වුවත් පෙළෙහි දක්නට ලැබෙන්නේ සූත්‍ර 7241 කි. එහි සූත්‍ර 521 ක් අස්ථානගත වීමක් සිදුවී ඇති බව පෙනේ. එසේ ම ඉංග්‍රීසි සංස්කරණයෙහි ද සූත්‍ර ගණනය කර ඇත්තේ 2889 ක් පමණි.[1] මෙසේ සංයුක්ත නිකායෙහි සූත්‍ර සංඛ්‍යාව ගණනය පිළිබඳ විෂමතාවක් දැකිය හැකිය. අටුවාචාරී බුද්ධඝෝෂ හිමියන් නිකාය ග්‍රන්ථයන්ට සැපයූ විවරණ අතුරින් සංයුක්ත නිකායට විවරණ දක්වමින්,

> සංයුත්තවග්ගපතිමණ්ඩිතස්ස සංයුත්ත ආගමවරස්ස
> බුද්ධානුබුද්ධසංවණ්ණිතස්ස ඤාණප්පභෙදජනනස්ස[2]

යනුවෙන් දේව, බ්‍රහ්ම හා ගෘහපති ආදීන් හා සංයුක්තව දේශනා කළ සූත්‍ර ඇතුළත් එසේ ම බුද්ධ, අනුබුද්ධවරයන් විසින් දේශනා කරන ලද, ඥාන ප්‍රභේදය ජනනය කරන සූත්‍ර ඇතුළත් කාණ්ඩය සංයුක්ත නම් වන බව දක්වයි. ප්‍රථම සංගීතයේ දී සංයුක්ත නිකායේ භාරකාරත්වය පැවැරෙනුයේ මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට යි.

මෙම ලිපියෙන් අපගේ අවධානය යොමුවෙනුයේ සගාථක වර්ගයේ බ්‍රාහ්මණ සංයුක්තය පිළිබඳ විමර්ශනය කිරීම යි. ගද්‍ය පාඨ සමඟ ගාථා මිශ්‍රිතව සංග්‍රහ වීම සගාථක වර්ගයෙහි විශේෂත්වය යි. එයින් ක්‍රි. පූ. හයවෙනි සියවසේ බුදුරදුන් ධරමාන අවදියේ විසූ විවිධ බ්‍රාහ්මණයන්ගේ කථා පුවත් අන්තර්ගත වීම බ්‍රාහ්මණ සංයුක්තයේ සුවිශේෂත්වය යි. ධනඤ්ජානී බැමිණියගේ සහ භාරද්වාජ බ්‍රාහ්මණයාගේ කථා පුවතින් පටන්ගෙන අක්කෝසක, අසුරින්දක, බිලඞ්ගික, අහිංසක, ජටා, සුද්ධික, අග්ගික, සුන්දරික සහ බහුධීතු යන භාරද්වාජ ගෝත්‍රික බමුණන් දස දෙනෙකුගේ කථා ප්‍රවෘත්ති පළමු කොටසට ඇතුළත් වේ. කසීභාරද්වාජ පුවතින් පටන් ගන්නා දෙවෙනි කොටස උදය, දෙවහිත, මහාසාළ, මානත්ථද්ධ, පච්චනීක, නවකම්මික, කට්ඨහාර, මාතුපොසක, භික්ඛක, සඞ්ගාරව සහ ඛොමදුස්ස යන

බ්‍රාහ්මණයන් දොළොස් දෙනෙකුගේ විස්තරවලින් සමන්විතය. ඒ සියල්ල අරහන්ත වග්ග සහ උපාසක වග්ග යනුවෙන් ප්‍රභේද දෙකකින් යුක්තය. ඒ අනුව අරහන්ත වග්ගය සූත්‍ර 10 කින් ද උපාසක වග්ගය සූත්‍ර 12 කින් ද සමන්විත ය. අන්‍යමතධාරී බ්‍රාහ්මණයන් බුදුන් සරණ ගොස් රහත් භාවයට පත්වීම විවරණය කෙරෙන පුවත් අරහන්ත වග්ගයටත් තෙරුවන් සරණ ගොස් උපාසකයන් පමණක් බවට පත් වූ පුවත් උපාසක වග්ගයටත් අයත් වේ.

## බ්‍රාහ්මණ සංයුක්තයෙන් විවරිත බුද්ධකාලීන බ්‍රාහ්මණ සමාජය

ක්‍රි. පූ. හයවෙනි සියවසේ බුද්ධකාලීන සමාජයේ උසස්ම කුලය ලෙස සම්භාවිත වූයේ බ්‍රාහ්මණ සමාජය යි. ඔවුන්ට පැවරුණු ප්‍රධාන කාර්යය පුද පූජා පැවැත්වීම, යාග කිරීම සහ යාග කරවීම වුවත් සමාජයේ විවිධ ක්ෂේත්‍රවල නිරතව විසූ බ්‍රාහ්මණ පිරිස් පිළිබඳ ප්‍රාමාණික විවරණයක් බ්‍රාහ්මණ සංයුක්තයෙන් පිළිඹිබු වේ. ඇතැම් බමුණෝ බෞද්ධ දර්ශනය නිසා තමාගේ බ්‍රාහ්මණ ආගම විශාල අභියෝගයකට පත්ව ඇති හෙයින් බුදුරදුන් සමඟ වෛරයෙන් යුක්තව වාද විවාද කොට පරාජය කිරීමේ අදහස් ඇති පිරිසක් වූහ. තවත් පිරිසක් බුදුරදුන්ගෙන් තමා නොදන්නා කරුණු මනාව දැනගැනීමේ අභිලාෂයෙන් උන්වහන්සේ වෙත සමීප වූහ. ඇතැමෙක් බුදුරදුන් මෙන් ම බ්‍රාහ්මණයින් වන තමා ද සමතත්ත්වයෙහිලා සලකන්නට පෙලඹුණහ. මෙසේ සංකීර්ණ බ්‍රාහ්මණ චරිත ස්වරූපාවලියකින් යුක්ත පිරිසක් බ්‍රාහ්මණ සංයුක්තයෙන් විවරිත වේ.

භාරද්වාජ යනු එකල විසූ ප්‍රධාන බ්‍රාහ්මණ පරම්පරාවකි. භාරද්වාජ ගෝත්‍ර එක් බමුණෙකුගේ ධනඤ්ජානී නම් බැමිණිය බුදුදහම වැළඳ නිතර බුදුරදුන්ගේ ගුණ වර්ණනා කරයි. මෙම කථා ප්‍රවෘත්තිය මජ්ඣිමනිකායේ සංගාරව සූත්‍රයෙහි ද ඇතුළත් වේ.[3] බැමිණියගේ ගුණ වැයුම අසා සිටීමට නොහැකිව කෝපයෙන් ඇවිලී යන බමුණා බුදුරදුන් කෙරෙහි පමණක් නොව ස්වකීය බිරිඳ වූ ධනඤ්ජානී බැමිණියට ද 'මුණ්ඩක ශ්‍රමණයාගේ ගුණ කියන වසලිය' යැයි අක්‍රෝශ පරිභව කරයි. බුදුගුණ ඉවසිය නොහැකිව කිපුණු ඇවිළුණු බමුණා බුදුරදුන් හමුවට පැමිණ උන්වහන්සේ සමඟ වාදකොට පරාජය කිරීමේ අභිලාෂයෙන් 'කුමක් නසා සැප ලැබිය හැකි ද? කුමක් නසා ශෝක නොකළ හැකි ද? කිනම් දහමක් නැසීම කැමැත්තෙහි ද?'[4] වශයෙන්



ප්‍රශ්න මාලාවක් ඉදිරිපත් කරයි. බමුණාගේ කෝපයෙන් යුක්තව පැන විමසුම අවබෝධ කරගත් බුදුරදුන් ක්‍රෝධය නසා සුවසේ හොවින බවත් ක්‍රෝධය නැසීමෙන් ශෝක නොකෙරෙන බවත්, ක්‍රෝධය නැසීම ආර්යයන් ප්‍රශංසා කරන බවත් පැහැදිලි කරන ලදි. එයින් පැහැදුණු බමුණා බුදුරදුන් සමීපයෙහි පැවිදිව නොබෝ කලකින් රහත් තෙරනමක් බවට පත්වූයේය.

ඇතැම් බ්‍රාහ්මණිකයෝ බුදුරදුන් සමඟ සමතත්ත්වයෙහිලා සැලකීමට පෙලඹුණහ. බුදුන් වහන්සේගේ අවිහිංසාවාදී සංකල්පයෙන් මුළු භාරතය පුරාවටම කුලභේදයකින් තොරව ශුභසිද්ධිය ව්‍යාප්ත වුණි. ඇතැම් බමුණෝ ස්වකීය නාමය සමඟ පමණක් බුදුරදුන් හා සමාන වෙතැයි සිතූහ. අහිංසක බ්‍රාහ්මණ චරිතය එවැන්නෙකි. භාරද්වාජ ගෝත්‍රික අහිංසක නම් බමුණා බුදුරදුන් වෙත පැමිණ තමන් නමින් අහිංසක වන බව පැවසීය. ඔහුට පිළිතුරු දෙන බුදුරදුහු නාමයෙන් කෙසේ වුවත් සිතින් කයෙන් වචනයෙන් යමෙකුට හිංසාවක් පීඩාවක් නොකෙරේද ඔහු ඒකාන්තයෙන් අහිංසක නම් වන බව වදාළහ.[5] අහිංසක භාරද්වාජ තෙමේ ද බුදුසසුනෙහි පැවිද්ද ලබා උතුම් රහත් තෙර නමක් බවට පත්වූයේය.

ස්වකීය බ්‍රාහ්මණ ආගමට බුදුදහමින් අභියෝග ඉදිරිපත් වන්නට වූ හෙයින් බොහෝ බ්‍රාහ්මණිකයෝ බුදුරදුන් විවේචනය කොට බුදුදහමට නිග්‍රහ කිරීමේ අදහසින් විවිධ වාද විවාදවලට ඉදිරිපත් වූහ. ඔවුහු වේද ශාස්ත්‍රය පිළිබඳ යම් අවබෝධයක් තිබුණු පිරිසෙකි. ධනඤ්ජානී මෙන්ම අක්කෝසක, අසුරින්දක, බිලංගික භාරද්වාජ වැනි බ්‍රාහ්මණිකයන්ගේ කථා පුවත්වලින් ඒ බව සනාථ වේ. බුදුන් වහන්සේගේ දර්ශනය අගය කළ තවත් බ්‍රාහ්මණ පිරිසක් ද වූ අතර ඔවුහු උන්වහන්සේ හමු වී අවවාද, උපදෙස් ලබාගෙන ස්වකීය ජීවිතය සාර්ථක කරගත්හ. ජටා භාරද්වාජ, මාතුපෝසක, භික්ඛක වැනි චරිත එවැනි ස්වභාවයකින් යුක්ත වූහ.

## බුදුරදුන් සහ බ්‍රාහ්මණයින් අතර සිදු වූ වාද

බ්‍රාහ්මණ සමාජය ඥානගවේෂී පසුබිමක පදනම්ව තිබුණ නමුත් බුදුරජාණන් වහන්සේට බලවත් කෝපයෙන් යුක්තව නොයෙක් අසභ්‍ය වචනයෙන් බැණ වැදුණු, පරිභව කළ, තර්ජනය කළ බමුණෝ ද සිටියහ. බුදුන් වහන්සේ ඉතා සංසුන්ව, ප්‍රිය වචනයෙන්

විස්තරාත්මක ධර්ම කරුණුවලින් පිළිතුරු දුන්විට ඔවුන්ගේ කෝපය යටපත්ව ක්‍රමයෙන් බුදුන් වහන්සේ කෙරෙහි බලවත් ප්‍රසාදයට පත්වන්නට වූහ. එසේ ම ඔවුන් කෝපයෙන් මිදී බුදුසමය වැළඳගෙන පිරිසක් ප්‍රව්‍රජ්‍යාව ලබා උතුම් රහත් භාවයටත් තවත් පිරිසක් තෙරුවන් සරණ ගිය උපාසක පිරිසක් බවටත් පත්වූහ. බ්‍රාහ්මණ සංයුක්තයේ එන භාරද්වාජගොත්ත, අක්කෝසක භාරද්වාජ, අසුරින්දික, බිලංගික ආදි චරිත එබඳු නිදර්ශන කිහිපයකි.

භාරද්වාජගොත්ත බමුණාගේ බිරිඳ වූ ධනඤ්ජානී බැමිණිය බුදුදහම වැළඳ සිටි අතර ඈ නිතර බුදුගුණ කියමින් වන්දනා කරන පුවත ආරම්භයේ දී ම සඳහන් කෙරුණි. මෙය ඉවසිය නොහැකිව කිපුණු බමුණා බුදුරදුන් හමු වී වාදයකට එළඹ 'කුමක් නසා සැප ලැබිය හැකි ද?' ආදි පැන විචාළේය. කෝපයෙන් තමා වෙත පැමිණි බමුණාගේ ස්වභාවය අවබෝධ කරගත් බුදුරදුන් 'සැප ලැබීමට කෝපය නැති කළ යුතුය' ආදි වශයෙන් අවස්ථෝචිත ධර්ම කරුණු විවරණයක් ඉදිරිපත් කළහ. බමුණාගේ කෝපය මෙත් සිතින් ඉවසා මැනවින් ධර්ම කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔහුගේ කෝපය සංසිඳුණි. එසේම ඔහු බුදු සසුනෙහි පැවිද්ද ද ලබා අවසානයේ උතුම් රහත් තෙර නමක් දක්වා උසස් ආධ්‍යාත්මික තලයකට පත්වූයේය.

තම වැඩිමහල් සොහොයුරා වූ භාරද්වාජගොත්ත බමුණා බුදුරදුන් සමීපයෙහි පැවිදි වූ බව අසා කෝපයට පත් අක්කෝසක භාරද්වාජ නම් බමුණා පෙරසේම බුදුරදුන් වෙත පැමිණ අසභ්‍ය වූ පරුෂ වචන කියමින් උන්වහන්සේට බැණ වැදුණි. එහිදී බුදුරදුන් 'බ්‍රාහ්මණය, ආගන්තුකව ඔබගේ නිවසට පැමිණි හිතවත් ඥාති මිත්‍රාදීන්ට පිළියෙල කළ ආහාරයක් ඔවුන් නොපිළිගන්නේ නම් ඒවා ඔබ විසින් ම අනුභව කරන්නේ යම්සේද එසේම ඔබ මට අසභ්‍ය ලෙස බැණ වැදුණු කරුණු මම නොපිළිගන්නෙමි, ඒ සියල්ල ඔබ ම භාරගන්න'[6] යැයි ඉතා කාරුණිකව වදාළහ. උන්වහන්සේ ඉතා උපහාසාත්මක ප්‍රකාශයකින් බමුණාගේ කෝපය ප්‍රතික්ෂේප කළ බැවින් නැවත ඔහු කෝපයෙන් ම ප්‍රතිචාර දක්වන්නට විය. බමුණා ශ්‍රමණ ගෞතමයන් රහත් කෙනෙකැයි මුළු රටෙහිම ප්‍රචලිත බවත් එහෙත් දැන් කෝපයෙන් කථාකරන බවත් සඳහන් කළේය. එවිට බුදුරදුන් 'දැමුණු සමාන දිවිපැවතුම් ඇති මැනවින් දැන මිදුණු සන්සුන් වූ තාදී ගුණයෙන් යුත් නොකිපෙන රහතුන්ට ක්‍රෝධයක් නොමැති බවත්[7] කිපෙන්නෙකුට පෙරළා කිපේ ද එයින් ඔහුට පවක් වන බවත් පෙරළා



නොකිපේද දිනීමට දුෂ්කර වූ ක්‍රෝධ සංග්‍රාමය දිනන බවත්'[8] ආදි වශයෙන් කුපිත වීමේ ආදීනවත් නොකිපීමෙහි ආනිසංසත් විස්තර කරමින් දහම් දෙසූහ. අවසානයේ දී ඔහු ද බුදුරදුන් කෙරෙහි පැහැදී පැවිදිව නොබෝ කලකින් රහතන් වහන්සේ නමක් බවට පත්වූයේය.

අසුරින්දක භාරද්වාජ යනු අක්කෝසක භාරද්වාජයන්ගේ බාල සහෝදරයා ය. ඔහු ද බුදුරදුන් සමීපයෙහි පැවිදි වූ බැව් ඇසූ අසුරින්දක බුදුරදුන් වෙත කෝපයෙන් එළඹ අසභ්‍ය වූ පරුෂ වචනයෙන් බැණ වදිමින් අක්‍රෝශ පරිභව කෙළේය. එහි දී බුදුන් වහන්සේ 'අඥානයා පරුෂ වචනවලින් බැණ වදිමින් තමන් ජය ගත්තෙකැයි හඟී ද එය ඔහු ලබන පරාජයක්ම බවත් ඉවසීම ප්‍රගුණ කළ පුද්ගලයා ජයක්ම ලබන බවත්' වදාළහ.[9] අවසානයේ දී අසුරින්දක භාරද්වාජ තෙමේ ද බුදු සසුනෙහි පැවිදිව විදසුන් වඩා රහත් තෙරනමක් බවට පත්වූයේය.

ස්වකීය වැඩිමහල් සොහොයුරු වූ භාරද්වාජ, අක්කෝසක භාරද්වාජ සහ අසුරින්දක භාරද්වාජ බමුණන් බුදුරදුන් සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාව ලැබූ බැව් අසා බිලංගික භාරද්වාජ බමුණා කිසිවක් කරගත නොහැකිව කෝපයෙන්, නොසතුටු සිත් ඇතිව බුදුරදුන් සමීපයට පැමිණ එකත් පසෙක හුන්හ. බුදුරදුන් ඔහුගේ කෝපයෙන් යුත් චිත්ත විතර්කය දැන නික්ලේශී පුද්ගලයෙකුට අයහපතක් කෙරේද ඒ පාපය උඩු සුළඟට හසු වූ සියුම් දූහුවිල්ලක් මෙන් ඒ අඥානයා වෙත ම පැමිණෙන බව වදාළහ.[10] ධර්ම කරුණු විවරණය කිරීම අවසානයේ දී ඔහු ද පැවිද්ද ලබා උතුම් රහත් භාවයට පත්වූයේය.

පච්චනීකසාත නම් බමුණා බුදුරදුන් යමක් කියයි ද ඒ කියන සියලුම වදන්වලට තමා විරුද්ධ වෙන්නෙමියි සිතා උන්වහන්සේ හමුවට පැමිණ දහම් දෙසනු මැනවැයි පැවසීය. ඔහුගේ සිත තුළ වූයේ බුදුරදුන්ගේ සියලු මතවලට විරුද්ධ වෙමින් උන්වහන්සේ පිරිස් මැද අවමානයට, අපහසුතාවට පත්කොට පරාජය කිරීමේ අදහස යි. එහෙත් ඔහුගේ සිතේ ස්වභාවය අවබෝධ කරගත් බුදුරදුන් විරුද්ධ, වෛරී අකුසලයන්ගෙන් කිලිටි සිත් ඇති පුද්ගලයාට සද්ධර්මය දැනගත නොහැකි බවත් සිතේ අප්‍රසාදය, බද්ධ වෛරය දුරුකොට පිරිසිදු සිතෙන් දහම් ඇසීමෙන් ධාරණය කරගත හැකි බවත් වදාළහ.[11] අවසානයේ දහම් කරුණු අවබෝධ කරගත් පච්චනීකසාත බුදුසසුනෙහි තෙරුවන් සරණ ගිය උපාසකයෙක් බවට පත්වීය.

## බ්‍රාහ්මණික යාග විධි - අග්නිහෝම

යාගය වනාහි බ්‍රාහ්මණයින්ගේ ප්‍රධාන ඇදහීම් ක්‍රමය යි. යාග කිරීම බ්‍රාහ්මණයන්ගේ ප්‍රධාන කාර්යය යි. එනිසාම ඔවුහු යාගවිධි, යාග මන්ත්‍ර, යාග විශේෂ, යාග උපකරණ වශයෙන් යාගයට අවශ්‍ය සෑම අංශයක් ම සම්පාදනය කළහ. බ්‍රාහ්මණයින් හඳුන්වා දුන් යාගයෙහි නිරර්ථක භාවය බුදුන් වහන්සේ විසින් දීඝනිකායේ කූටදන්ත සූත්‍රයේ දී මැනවින් විවරණය කෙරේ.[12] බ්‍රාහ්මණයින් සතුන් මරමින් සිදුකළ ප්‍රධාන යාග පහක් පිළිබඳ කෝසල සංයුක්තයේ යඤ්ඤ සූත්‍රයේ සඳහන් වේ. ඒවා අස්සමේධ, පුරිසමේධ, සම්මෝපාස, වාජපෙය්‍ය සහ නිරග්ගල වශයෙනි.[13] මේ හැරුණුකොට සත්ව හිංසාවකින් තොරව ගින්නට යාග ද්‍රව්‍ය බහා පවත්වනු ලබන අග්නිහෝම නම් යාගයක් බ්‍රාහ්මණ සංයුක්තයේ සුන්දරික භාරද්වාජ පුවතින් විස්තර වේ. අග්නිහෝම යාගයෙන් කිසිවෙකුට හිංසාවක් පීඩාවක් නොමැත. ගිනි පිදීම අවසානයෙන් ඔවුන් හව්‍යශේෂය හෙවත් යාගයෙන් ඉතිරි වූ ආහාර කොටස මහබඹුගේ මුවෙන් උපන් බ්‍රාහ්මණයෙකුට ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වේ. එයින් මහාබ්‍රහ්මයා සන්තර්පනය කිරීමත් බ්‍රහ්මලෝකගාමී මාර්ගය පිරිසිදු කිරීමත් අපේක්ෂා කෙරිණි.

සුන්දරික නදීතෙර වසමින් ගිනි පුදමින් අග්නි හෝමය කරමින් විසූ හෙයින් සුන්දරික භාරද්වාජ නම් වූ මොහු ගිනි පුදා අග්නි හෝමය කොට ඉතිරි යාග ද්‍රව්‍ය කවරෙකුට පිළිගන්වන්නේදැයි හාත්පස බැලීය. එකල ගසක් මුල වැඩහුන් බුදුරදුන් දැක මවතින් යාග ද්‍රව්‍යය ද දකුණතින් පැන් කෙණ්ඩිය ද ගෙන උන්වහන්සේ වෙත එළඹියේය. ඔහුගේ පා හඬින් බුදුරදුන් හිස ඔසවා බැලූ කල හිස මුඩු කල අයෙක් යැයි දැන මොහු මුණ්ඩකයෙකි යැයි පෙරළා යෑමට සූදානම් වීය. හිස මුඩු කළ බමුණෝ ද වෙතැයි සිතා නැවත පැමිණ ජාතිය විමසිය යුතු යැයි සිතා කිනම් ජාතියක අයෙක් දැයි විචාළේය. ජාතිය නොවිචාරව, සීලාදි චරණයම විචාරව. දර කැබැල්ලෙන් ගිනි හටගන්නාක් මෙන් පහත් කුලයෙහි හෝ උසස් කුලයෙහි ඉපදීමෙන් වීර්යවත් වේද පවට ලැජ්ජා ඇත්තේ ද හේ මුනි නම් වන බව වදාළහ. පරමාර්ථ සත්‍යයෙන් ද ඉන්ද්‍රිය දමනයෙන් ද චතුස්සත්‍ය වේදයෙහි පරතෙරට ගියේ ද එබඳු දක්ෂිණාර්හ වූ උත්තමයන් කෙරෙහිම යාග කෙරේවායි වදාළහ.[14] එසේ නම් වේදයෙහි පරතෙරට ගිය ඔබට මේ පායාසය පිළිගන්වන බව ද එය පිළිගන්නා ලෙස ද ආයාචනය කර සිටියි. එවිට ගාථාභිගීත



පායාසය පිළිගැනීම ස්වභාවය නොවන බැවින් සියලු ගුණයෙන් යුත් මහර්ෂි වූ රහත් උතුමන්ටම මෙයින් තොර වූ කැප ආහාරයෙන් උපස්ථාන කරන ලෙසත් එය මහා පින්කෙතක් වන බවත් වදාළහ.

එසේ නම් මෙම පායාසය කවරෙකුට පුදන්නේ දැයි විමසූ කල තථාගත ශ්‍රාවකයෙක් හැරුණු කොට වෙනත් අයෙක් නොමැති බවත් මේ භුතාවශේෂය ගෙනගොස් තණ නැති බිමක හෝ පණුවන් නැති ජලයක පා කර හරින ලෙස පෙන්වා දුන්හ. ඒ අනුව පණුවන් නැති දියෙක බහාලූ කල 'චිච්චිටායති චිටිච්චිටායති සන්ධූපායති සම්පධූපායති' වශයෙන් 'චිච්චිටි චිටිච්චිටි' අනුකරණයත් දුම් දමන්නටත් විය. එයින් සංවේගයත් මවිතයටත් පත් බමුණා බුදුන් කරා පැමිණි කල දියට දැමීමෙන් පාරිශුද්ධියක් ලද නොහැකි බවත් තමා ස්වසන්තානයේ ඥානාග්නියම දැල්වූ බවත් වදාළහ. එසේම බමුණාගේ මානය නම් තවුස් පිරිකරය, ක්‍රෝධය දුමය, මුසාබස් හළුය, දිව ස්ථානයය, හෘදය ගිනි දැල්වෙන තැනය, සිත ගින්නය වශයෙන් වෙන්කර පෙන්වා දුන්හ.[15] නිවන් අවබෝධ කරගත් ආර්යයන් වහන්සේම නමස්කාර කරන ලෙසත් එය අර්ථ සහිත ප්‍රතිපත්තිය බැව් අවබෝධ කරදුන් කළ මොහු ද ගෞතම ශාසනයෙහි පැවිද්ද ලබා උතුම් රහත් තෙරනමක් බවට පත් වූහ. නිරර්ථක අග්නි හෝමය දුරුකොට අර්ථවත් පාරිශුද්ධ සීලයෙහි හැසිරීමට බුදුන් වහන්සේ විසින් නිර්දේශිත ය. අග්නිහෝමය සත්ව හිංසනයකින් තොරව සිදුකළ යාගයක් වුව ද එය ද බුදුදහම විසින් අනුමත නොකළ අයුරු මෙයින් පැහැදිලි වේ.

## උදකපාරිශුද්ධිය

බ්‍රාහ්මණිකයන් විසින් ස්වකීය පාරිශුද්ධිය වෙනුවෙන් අනුගමනය කළ තවත් ක්‍රමවේදයක් නම් උදෑසන සහ සවස දියට බැස ස්නානය කිරීම යි. එය උදකපාරිශුද්ධිය නමින් හැඳින්වේ. සංගාරව බ්‍රාහ්මණයා උදේ සවස දියට බැස ස්නානය කිරීමේ ව්‍රතයෙහි හෙවත් උදකපාරිශුද්ධියෙහි නිරතව පාරිශුද්ධත්වය විශ්වාස කළ අයෙකි. ආනන්ද තෙරුන් මොහුගේ අසාර්ථක වූ උදකපාරිශුද්ධි ව්‍රතය දැක බුදුරදුන්ට සැළකළහ. බුදුන් වහන්සේ සංගාරව බමුණාගේ නිවෙස වෙත වැඩම උදේ සවස දියට බැස ස්නානය කිරීමේ ව්‍රතයෙහි යෙදෙමින් කිනම් පාරිශුද්ධියක් අපේක්ෂා කෙරේ දැයි විමසීය. තමා දහවල් යම් පවක් කළේ නම් සවස නැමෙන් ඒ සියලු පාපයන් පා



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
02 OCT 2015

කොට හරින බවත් රාත්‍රි යම් පවක් කළේ නම් එය උදේ නෑමෙන් පා කොට හරින බවත් මේ ආනිසංස දකිමින් උදක පාරිශුද්ධිය උදේ සවස කරන බව පැවසීය. එවිට බුදුරදුන් ධර්ම කරුණු පැහැදිලි කරදෙමින් වේදයෙහි පරතෙරට ගිය ආර්යයන් යම් තැනක ස්නානය කෙළේ ද තෙත නොවූ ශරීර ඇතිව නිවන නමැති පරතෙරට ඒකාන්තයෙන් පැමිණෙත් ද ධර්මය සිල් නැමැති තොට ඇති විශේෂයෙන් ප්‍රසන්න වූ උතුම් සත්පුරුෂයන් විසින් ප්‍රශංසා කරන ලද ජලාශයක් බව පෙන්වා දුන්හ.[16] අවසානයේ දී සංගාරව තෙමේ ද නිරර්ථක උදක පාරිශුද්ධිය අතහැර බුදු සසුනෙහි උපාසකයෙක් බවට පත්වූයේය.

**බෞද්ධ බ්‍රාහ්මණික සංකල්පය**

බ්‍රාහ්මණ සමාජයේ අර්ථ විරහිත ක්‍රියා ප්‍රතික්ෂේප කළ බුදුන් වහන්සේ අර්ථවත් බ්‍රාහ්මණ සමාජය යනු බුද්ධ ශ්‍රාවක කොට්ඨාසය බව පෙන්වාදුනි. බ්‍රාහ්මණ දහමේ ඉගැන්වූ ත්‍රිවේදය වෙනුවට ත්‍රිවිද්‍යාව ඉදිරිපත් විය. බ්‍රාහ්මණ යාගය වෙනුවට ප්‍රතිඵල සහිත දානයත් බ්‍රාහ්මණ චරණ ධර්ම අර්ථශූන්‍ය ඒවා බවත් එහි යථාතත්වය බුදුදහමෙන් ඉගැන්වෙන ආකාරයත් පෙන්වාදුනි. බුදුදහම තුළින් ඉදිරිපත් කළ මෙම නවතම බ්‍රාහ්මණ සංකල්පය බුදුදහම කෙරෙහි බ්‍රාහ්මණ අවධානය යොමුකරවා ගැනීමට යෙදූ සාර්ථක උපාය මාර්ගයක් ද විය. බුදුදහමෙහි බ්‍රාහ්මණයා යනු මහරහතන් වහන්සේය. එකල සමාජ සම්මතයෙහි පැවැති බ්‍රහ්ම යෝනියෙහි උපන් පමණකින් හෝ බැමිණියක මව වූ පමණින් හෝ බ්‍රාහ්මණයෙක් වීමේ මතය බුදුදහම ප්‍රතික්ෂේප කරයි. බමුණු කුලයෙහි උපන් නමුත් යමෙක් රාගාදී පලිබෝධවලින් යුක්ත වේ නම් එවැන්නෙක් දකින දකින අයට පින්වත, පින්වත (භො භො) යැයි කියන භෝවාදියෙක් මිස නියම බමුණෙක් නොවේ. රාගාදි පලිබෝධ නැති ආශා රහිත පුද්ගලයා පමණක් බ්‍රාහ්මණයෙකැයි[17] සඳහන් කරන බව ධම්මපද පාලියෙහි දී බෞද්ධ බ්‍රාහ්මණ සංකල්පය මැනවින් පැහැදිලි කරදෙනු ලැබේ. එසේ ම බෞද්ධ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයාගේ ස්වරූපය මැනවින් විවරණය කරන ආකාරය මජ්ඣිමනිකායේ වාසෙට්ඨ සූත්‍රයෙන් ද හමුවේ.

ජටාධාරී ජටා නම් බමුණාට බුදුරදුන් පවසන්නේ ජාති මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් බමුණෙක් නොවන බවත් ජාතියෙන් බ්‍රාහ්මණයෙකැයි පිළිගැනීම මිථ්‍යාවක් බවත් ය. ජටා භාරද්වාජ බමුණා



බුදුරදුන් හමුවට පැමිණ ඇතුළතත් පිටත් අවුල්ය, මිනිසුන් අවුලෙන් අවුලට පත්වේ. මේ අවුල් නිරවුල් කරනුයේ කවරෙක්දැයි විචාළේය.[18] ප්‍රඥාවන්තයා සීලයෙහි පිහිටා සමාධිය හා ප්‍රඥාව වඩා තෘෂ්ණා මූලික අවුල් නිරවුල් කරන බවත් යමෙක් රාග දෝෂ අවිජ්ජාදිය දුරුකරන ලද්දේ ද ඒ ක්ෂීණාශ්‍රව රහත්හුම බැව් ද[19] එතුමන් තෘෂ්ණා අවුල නිරවුල් කර ඇති බවත් යම් තැනක නාම රූප ප්‍රතිඝා රූප සංඥාවන්ගේ නිරුද්ධ වීම වේද එහි මේ තෘෂ්ණා අවුල සිඳෙන බවත් බුදුන් වහන්සේ වදාළහ. අවසානයේ ජටා තෙමේ ද ක්ෂීණාශ්‍රව රහත් තෙරනමක් බවට පත්වූයේය.

බ්‍රාහ්මණත්වයට ජාතිය ප්‍රධානතම කරුණ වූ අතර සැබෑ බමුණෙක් වීමට නම් ත්‍රිවිද්‍යා හා චරණ ධර්මයන්ගෙන් යුක්ත විය යුතු බැව් බමුණෝ පිළිගත්හ. ඔවුන්ගේ ත්‍රිවිද්‍යාව නම් ත්‍රිවේදයයි. චරණ නම් ගෝත්‍රයයි.

සුද්ධික භාරද්වාජ තෙමේ බුදුරදුන් හමුවට පැමිණ ලෝකයෙහි කිසිම බමුණෙක් සිල්වත් කමින් හා තපස් රැකීමෙන් පිරිසිදු නොවන බවත් ත්‍රිවේදයෙන් හා බ්‍රාහ්මණ චරණධර්මයන්ගෙන් යුක්ත වූයේ ද ඔහුම පිරිසුදු අයෙක් වන බවත් පැවසීය.[20] බොහෝ ප්‍රලාප කියන, අභ්‍යන්තර ක්ලේශයන්ගෙන් කිලිටි වූයේ ජාති මාත්‍රයෙන් බමුණෙක් නොවන බව බුදුන් වහන්සේ වදාළහ. එසේම නිවනට යොමු වූ සිත් ඇති නිතර දැඩි උත්සාහයෙන් කටයුතු සලසන ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර, සැඬොල් හෝ පුක්කුස යන කවර ජාතියෙකු වුවත් උතුම් නිවනට පැමිණෙන බවත් වදාළහ.[21] අවසානයේ සුද්ධික භාරද්වාජ තෙමේ ද බුදුසසුනෙහි පැවිදිව උතුම් රහත් තෙර නමක් බවට පත්වූයේය.

අග්ගික භාරද්වාජ බමුණා ගිනි පුදමියි, අග්නි හෝමය කරමියි ගිතෙල් මුසු කිරිබතක් පිළියෙල කළේය. එම අනර්ථ ක්‍රියාව දුටු බුදුරදුහු ඔහුගේ නිවෙස කරා පිණ්ඩපාතයෙහි වැඩියහ. උන්වහන්සේ දුටු බමුණා ත්‍රිවේදයෙන් යුක්ත වේද ජාතියෙන් උසස් වේද, වේද ග්‍රන්ථ හදාළ අයෙක් වේද, බ්‍රාහ්මණ චරණ ධර්මයන්ගෙන් යුක්ත වේද එවැනි අයෙකුට මිස වෙන අයෙකුට මෙය නොපිළිගන්වන බව ප්‍රකාශ කළේය.[22] එවිට බුදුන්වහන්සේ බොහෝ ප්‍රලාප කියන, ක්ලේශයන්ගෙන් කිලිටි වූ සිත් ඇති අයෙක් ජාති මාත්‍රයෙන් පමණක් බමුණෙක් නොවන බැව් වදාළහ.[23] එසේම යමෙක් පෙර විසූ කඳ පිළිවෙල දනී ද දිව්‍යලෝක, අපාය දනී ද උතුම් අර්හත්වය පසක් කළේ

ද චතුස්සත්‍ය අවබෝධ කළේ ද මේ ත්‍රිවිද්‍යාවෙන් යුක්ත බමුණා තෙවිජ්ජ නම් වේ. එබඳු උතුමෙකුට මෙම පායාසය වැළඳීමට සුදුසු බව වදාළහ.[24] අනතුරුව බුදුරදුන්ට ආහාරය පිළිගැන්වීමට සූදානම් වූ විට ගාථාභිගීතව ලබා ගන්නා ආහාර නොවළඳන බවත් එය පිළිගැනීම ආජීව පාරිශුද්ධ ශීලයේ ස්වභාවය නොවන බවත් අකැප දෙයම ප්‍රතික්ෂේප කොට කැප දෙයම වැළඳීම ස්වභාවය බවත් වදාළහ. මහරහතුන්ට කැප ආහාරයෙන් උපස්ථාන කරන ලෙසත් එය පින්කෙතක් බවත් වදාළහ. ධර්ම කරුණු අවබෝධ කරගත් අග්ගික භාරද්වාජ තෙමේ ද බුදුසසුනෙහි පැවිද්ද ලබා උතුම් රහත් භාවයට පත්වූයේය.

බුදුරදුන් ශාක්‍ය ජනපදයෙහි ඛෝමදුස්ස නියම්ගම පිඬු පිණිස වැඩි කළ ඒ ගමෙහි බ්‍රාහ්මණ ගෘහපතියෙක් කිසියම් කටයුත්තක් සඳහා සභා ශාලාවට රැස්විය. එවිට වැසි පොදක් ද ටිකෙන් ටික ඇද හැලුණි. බුදුන් වහන්සේ ද සභාව වෙත වැඩම කළ විට ඛෝමදුස්සක බ්‍රාහ්මණ ගෘහපතියා බුදුරදුන් දුර සිටම දැක නින්දිත මුඬු මහණ කවරෙක් ද, කවර කෙනෙක් සභාධර්මය දන්නේදැයි විචාළේය. යම්තැනක සත්පුරුෂයෙක් නොවේ ද එතැන සභාවක් නොමැති බවත් යමෙක් ධර්මය නොකියයි ද හේ සත්පුරුෂයෙක් නොවන බවත් රාග දෝස මෝහාදිය දුරුකොට ධර්මය දේශනා කරනුයේ ද හේ සත්පුරුෂයෙක් ම වන බව වදාළහ.[25] දහම් කරුණු විවරණය අවසානයේ දී ඛෝමදුස්සක බමුණා ද තෙරුවන් සරණ ගිය උපාසකයෙක් බවට පත්වූයේය.

## බ්‍රාහ්මණයින්ගේ ශුභසිද්ධිය උදෙසා බුදුරදුන් ගත් ක්‍රියාමාර්ග

බ්‍රාහ්මණික වංශිකයන් එකල සමාජයේ ඉහළම සමාජ මට්ටමක වැජඹුණු නමුත් බොහෝ දෙනෙක් බුදුරදුන් හමුවට පැමිණ අර්ථවත් වූ ආර්ය මාර්ගය අවබෝධ කරගත්හ. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ බ්‍රාහ්මණ වංශකයින් බුදුසසුනෙහි පැවිද්ද ලබා උතුම් ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා බවට පත්ව මිනිසුන්ගේ ශුභසිද්ධිය උදෙසා විශාල දායකත්වයක් ලබාදෙන්නට පෙලඹුණි. බමුණු දහමෙන් අතරමං වී සිටි තවත් පිරිසක් බුදුන් වහන්සේ හමුවට පැමිණ තමන්ගේ ජීවිතය සුවපත් භාවයට පත්කර ගත්හ. බුදුරදුන් විශාල බ්‍රාහ්මණ පිරිසකගේ ජීවිතවලට



ආත්ම ශුභසිද්ධිය ලබාදුන් ආකාරය බ්‍රාහ්මණ සංයුක්තයේ නිදර්ශන කථා ප්‍රවෘත්තීන් කීපයකින් ම අනාවරණය වේ.

බහුධීතු සූත්‍රයෙන් භාරද්වාජගෝත්‍ර බමුණෙක් තමන් සතු ගවයන් 14 දෙනෙක් අතුරුදහන් වීම හේතුවෙන් බුදුන් වහන්සේ වෙත එළඹ ගාථා පෙළකින් තමාගේ වේදනාවෝ ඉදිරිපත් කරති. ගවයන් 14 දෙනෙක් දින 7 ක් තිස්සේ අතුරුදහන් වීම, තල වගාව අසාර වීම, හිස් වූ ධාන්‍යාගාරයේ මීයන් විසින් බොහෝ සේ විනාශ සිදුකිරීම, සත් මසක් ගත වූ තණ ඇතිරිල්ලෙහි ප්‍රාණීන් ගැවසී සිටීම, එක් පුතෙක් හා පුතුන් දෙදෙනෙක් ඇති වැන්දඹු දූවරු හත් දෙනෙක් සිටීම, ශරීරයේ කැළලින් යුත් තමාගේ බැමිණිය නිදා සිටින තමාට පාදයෙන් ගසා පුබුදුවාලීම, උදෑසන ණය හිමිකරුවෝ නිවසට පැමිණ ණය ඉල්ලා සිටීම යන කරුණු සියල්ලෙන් ම තමා අධික පීඩාවට පත්ව ඇති බවත් භවත් ගෞතමයන් මේවායින් මිදී සුව සේ වෙසෙන බවත් පැවසීය.[26] ඔහුගේ සියලු වේදනාවන් අසා සිටි බුදුන් වහන්සේ තමන් මේ සියලුම පීඩාවන්ගෙන් මිදුණ අයෙක් බවත් එසේම මනා සුව ඇත්තෙක් බවත් වදාළහ.[27] අවසානයේ දී භාරද්වාජ තෙමේ ද පැවිදිව බුදුසසුනෙහි තවත් උතුම් රහත් තෙරනමක් බවට පත්වනුයේ සියලු බැඳීම්වලින් තොර ප්‍රව්‍රජ්‍යාව උතුම්ම සැනසීම බව පසක් කරමිනි.

කසී සූත්‍රයෙන් කසීභාරද්වාජ බමුණා කෙත් වපුරන කාලයේ 500 ක් පමණ නඟුල් ගෙන සී සෑම කරන ලදි. බුදුරදුහු උදෑසන ඔහුගේ කෙත සමීපයට වැඩියහ. එවිට බමුණා ආහාර බෙදමින් සිටි අතර බුදුරදුන් පසෙක වැඩ සිටිනු දැක උන්වහන්සේ වෙත එළඹ තමා සී සෑම, වැපිරීම ආදිය කොට ආහාර සපයා ගන්නා බවත් ඔබත් එසේ කර ආහාර සපයා ගන්නා ලෙස පැවසීය. එවිට බුදුරදුන් ද තමා සී සෑම, වැපිරීම කොට ආහාර සකසා ගන්නා බව වදාළහ. ශ්‍රමණ ගෞතමයන් කිසිදා වියදණ්ඩක්, නඟුලක්, සී වැලක්, කෙවිටක්, ගවයෙක් හෝ හසුරුවනු දැක නොමැති බවත් එහෙත් ගොවිතැන් කොට වළඳන බවත් පවසන බැව් කීය. ඔබ ගොවියෙක් නම් සී සාන්නේ කෙසේ දැයි නැවත විචාළේය. බුදුන් වහන්සේට අවශ්‍ය වූයේ ඔහුගෙන් එබඳු පැනයක් මතුවෙන තුරුය. එයට පිළිතුරු සපයන බුදුන් 'ශ්‍රද්ධාව බීජයයි. තපස වැස්සයි. ප්‍රඥාව වියදණ්ඩ හා නඟුලයි. ලජ්ජාව නඟුලිසයි. සිත ලණුවයි. සිහිය සී වැල හා කෙවිටයි'[28] යනුවෙන් සියල්ල ධර්මානුකූලව විවරණය කරන ලදි. එසේම තමන් කාය වාක් සුචරිතයෙහි ගෝපිත වූයෙක් බවත් ආහාරයෙන් සහ උදරයෙන් සංයත

වූයේ සත්‍යයෙන් ගොයම් නෙළීම සිදුකරන බවත් අර්හත්වය මීදීම බවත් බර ඉසිලීමෙහි සමත් තමාගේ වීර්යය යම් තැනකට ගොස් ශෝක නොකෙරේ ද ඒ නිවනට අභිමුඛ කොට පමුණුවනු ලබන තෙක් නොනවතින සේ හීය සාන ලද බවත් ඒ හීය අමාඵල ඇති බවත් එය සියලු දුකින් මිදෙන බවත්'[29] මැනවින් විවරණය කළහ. එවිට ශ්‍රමණ ගෞතමයෝ ද අමාඵල ඇති හීයක් සතු ගොවියෙක් බවත් මේ ආහාරය පිළිගන්නා ලෙසත් පැවසීය. ගාථාභිගීත ආහාරය ප්‍රතික්ෂේප කළ බුදුහු උත්සාහවත් ආර්යයන්ට කැප ආහාරය පමණක් පිළිගන්වන ලෙස වදාළහ. අවසානයේ දී කසීභාරද්වාජ තෙමේ ද බුදු සසුනෙහි පැවිද්ද ලබා උතුම් රහත් තත්ත්වයට පත්වූයේය.

උදය සූත්‍රයෙන් බුදුන් වහන්සේ උදෑසන පිඬු පිණිස උදය බමුණාගේ නිවස කර වැඩියහ. ඔහු බුද්ධ පාත්‍රය බතින් පිරවීය. දෙවෙනි තෙවැනි දිනයන්හි ද පිළිවෙළින් ඔහුගේ නිවස වෙත ම වැඩි අතර එසේම පාත්‍රය බතින් පුරවා තෙවෙනි දිනයේ දී රසයෙහි ගිජු වූ ගෞතම ශ්‍රමණයෝ පුන පුනා පැමිණේ යැයි පැවසීය. බුදුන් වහන්සේ උදය බමුණා සොයා වැඩියේ මෙම ප්‍රකාශය නිකුත් කරන තුරුය. එවිට බමුණා අමතා දහම් කරුණු විවරණය කරමින් 'ගොවියෝ පුන පුනා බීජ වපුරයි, වැස්ස පුන පුනා වසියි, ගොවියෝ පුන පුනා කෙත සාත්, ධාන්‍ය පුන පුනා රටට පැමිණේ,[30] යදියෝ පුන පුනා ඉල්ලති, දානපතීහු පුන පුනා දන් දෙති, දානපතීහු පුන පුනා දන් දී නිවනට පැමිණෙත්, කිරි දොවන්නෝ පුන පුනා කිරි දොවත්, වසු පැටියා පුන පුනා මව කරා පැමිණේ, සත්ත්වයෝ පුන පුනා ක්ලාන්ත වෙත්, කම්පිත වෙත්, බාලයා පුන පුනා ගැබට පැමිණේ, උපදී, මැරේ, සොහොනට යයි, නුවණැත්තෝ නිවන් ලැබ පුන පුනා නූපදිත්'[31] යැයි ධර්මය අවබෝධ කරදුනි. ධර්ම කරුණු අවසානයේ උදය බමුණා ද තෙරුවන් සරණ ගිය උපාසකයෙක් වූයේය.

මහාසාළ සූත්‍රයේ දී එක්තරා මහලු බමුණෙක් ජරා ජීර්ණ වස්ත්‍රවලින් යුක්තව බුදුන්වහන්සේ කරා එළඹෙයි. ඔහු දුටු බුදුරදුන් කුමන හේතුවක් නිසා මෙසේ වයෝ වෘද්ධව ජරා ජීර්ණ වස්ත්‍රවලින් යුක්ත සිටීදැයි විචාරයි. තමන්ට පුතුන් සිව් දෙනෙක් සිටි බවත් ඔවුන් අඹුවන් සමඟ එක් වී තමා ගෙයින් පිටිවහල් කල බවත් කීය. එවිට බුදුරදුන් දරුවන් සිටින සභාවකට ගොස් කියන ලෙස ගාථා මාලාවක් උගන්වයි. එනම් 'මට දාව උපන් යමෙක් සතුටුවේද යම් කෙනෙකුගේ අභිවෘද්ධිය පැතුයේ ද ඔවුන් අඹුවන් හා එක්ව මා බල්ලෙක්, ඌරෙක්



සේ ගෙවලින් එළවා දැමීය.[32] අසත්පුරුෂ වූ රකුසෝ දරුවන් මෙන් සිට 'පියාණෙනි, පියාණෙනි' කී මුත් වයෝවෘද්ධ වූ කළ එළවා දැමීය. වැඩකට ගත නොහැකි ජරා ජීර්ණ අශ්වයෙක් මෙන් පරිභෝග ධනය නැති බාලයන්ගේ පියා වූ තමාට ආහාර දීමෙන් තොර කරන ලදි. එනිසා අනුන්ගේ ගෙවල සිඟමනේ යමි. එම දරුවන්ට වඩා අද සැරයටියම මට ශ්‍රේෂ්ඨය. එය අඳුරේ යන විට පෙරටුව යයි. ගැඹුරු දියෙන් ගොඩ වීමට පිහිට වෙයි. වැටුණු විට නැවත නැඟී සිටීමට උපකාරී වේ.'[33] යන අර්ථවත් ගාථා පෙළ දරුවන් සහිත සභාවක කීමට සැලැස්වීය. එය ඇසූ දරුවෝ ස්වකීය වයෝවෘද්ධ පියා නිවෙස් කරා ගෙනගොස් නැවත උපස්ථාන කිරීමට පටන් ගත්හ. පසුව බමුණා වස්ත්‍ර යුගලයක් රැගෙන බුදුරදුන් වෙත එළඹ ආචාර්යය ධනය වශයෙන් සළු පිළිගැන්වීමක් ද සිදුකරන අතර අවසානයේ තෙරුවන් සරණ ගිය බෞද්ධ උපාසකයෙක් බවට පත්වෙනුයේ බුදුරදුන්ගේ ප්‍රඥාගෝචර ක්‍රියාවෙහි ප්‍රතිඵලය නිසාවෙනි.

මානයෙන් සිත උඩඟු වූ මානත්ථද්ධ නම් බමුණා මවට, පියාට, ගුරුවරුන්ට හා ජ්‍යෙෂ්ඨ සොහොයුරන්ට ගෞරව කිරීමක් හෝ වැඳීමක් සිදු නොකරයි. මෙකල භාග්‍යවතුන් වහන්සේ විශාල පිරිසකට ධර්ම දේශනා කරන කළ මානත්ථද්ධට මෙබඳු සිතිවිල්ලක් ඇතිවිය. 'මම ශ්‍රමණ ගෞතමයන් කරා යමි, ශ්‍රමණයන් කථා කළොත් පමණක් කථාකරමි. කථා නොකළොත් කථා නොකරන්නෙමි' යනුවෙනි. ඔහු බුදුන් සමීපයට ගියමුත් ඔහු සමඟ කිසිවෙක් කථා නොකළ බැවින් එතැනින් පිටවී යෑමට සූදානම් විය. ඔහුගේ සිතිවිලි දත් බුදුහු ඔහු අමතා මෙහි ප්‍රයෝජනය අපේක්ෂා කරන්නෙකුට මානය වැඩීම සුදුසු නොවේ. යම් ප්‍රයෝජනයක් හේතුකොට ගෙන පැමිණියේ නම් එයම සිදුකරනු මැනවැයි වදාළහ. තමාගේ සිත දැනගත් බැව් අවබෝධ කරගත් මානත්ථද්ධ සිරිපා මත වැඳ වැටී තමා මානත්ථද්ධ නම් බව බැව් පැවසීය. දෙමාපියන්ට, ගුරුවරුන්ට සහ ජ්‍යෙෂ්ඨ සොහොයුරන්ට ගරු නොකරන මොහු බුදු සිරිපා මත වැඳ වැටීම දුටු ජනයා මහත් පුදුමයට පත්විය. අනතුරුව ඔහු තමා කවරෙකුට මානය නොකරන්නේ ද, කවරෙකුට ගෞරව කරන්නේ ද, කවරෙකු පිදිය යුත්තේ ද, කවරෙකු මනාව පිදිය යුත්තේ දැයි විමසීය. බුදුහු දෙමාපියන්ට, ආචාරීන්ට සහ වැඩිමහල් සොහොයුරන් කෙරෙහි මානය ඇති කර නොගත යුතු බවත් නිති ගෞරව කළ යුතු බවත් මනාව පිදිය යුතු බවත් වදාළහ.[34] මෙසේ

වූයේ සත්‍යයෙන් ගොයම් නෙළීම සිදුකරන බවත් අර්හත්වය මිදීම බවත් බර ඉසිලීමෙහි සමත් තමාගේ වීර්යය යම් තැනකට ගොස් ශෝක නොකෙරේ ද ඒ නිවනට අභිමුඛ කොට පමුණුවනු ලබන තෙක් නොනවතින සේ හීය සාන ලද බවත් ඒ හීය අමාඵල ඇති බවත් එය සියලු දුකින් මිදෙන බවත්'[29] මැනවින් විවරණය කළහ. එවිට ශ්‍රමණ ගෞතමයෝ ද අමාඵල ඇති හීයක් සතු ගොවියෙක් බවත් මේ ආහාරය පිළිගන්නා ලෙසත් පැවසීය. ගාථාභිගීත ආහාරය ප්‍රතික්ෂේප කළ බුදුහු උත්සාහවත් ආර්යයන්ට කැප ආහාරය පමණක් පිළිගන්වන ලෙස වදාළහ. අවසානයේ දී කසීභාරද්වාජ තෙමේ ද බුදු සසුනෙහි පැවිද්ද ලබා උතුම් රහත් තත්ත්වයට පත්වූයේය.

උදය සූත්‍රයෙන් බුදුන් වහන්සේ උදෑසන පිඬු පිණිස උදය බමුණාගේ නිවස කර වැඩියහ. ඔහු බුද්ධ පාත්‍රය බතින් පිරවීය. දෙවෙනි තෙවැනි දිනයන්හි ද පිළිවෙළින් ඔහුගේ නිවස වෙත ම වැඩි අතර එසේම පාත්‍රය බතින් පුරවා තෙවෙනි දිනයේ දී රසයෙහි ගිජු වූ ගෞතම ශ්‍රමණයෝ පුන පුනා පැමිණේ යැයි පැවසීය. බුදුන් වහන්සේ උදය බමුණා සොයා වැඩියේ මෙම ප්‍රකාශය නිකුත් කරන තුරුය. එවිට බමුණා අමතා දහම් කරුණු විවරණය කරමින් 'ගොවියෝ පුන පුනා බීජ වපුරයි, වැස්ස පුන පුනා වසියි, ගොවියෝ පුන පුනා කෙත සාත්, ධාන්‍ය පුන පුනා රටට පැමිණේ,[30] යදියෝ පුන පුනා ඉල්ලති, දානපතීහු පුන පුනා දන් දෙති, දානපතීහු පුන පුනා දන් දී නිවනට පැමිණෙත්, කිරි දොවන්නෝ පුන පුනා කිරි දොවත්, වසු පැටියා පුන පුනා මව කරා පැමිණේ, සත්ත්වයෝ පුන පුනා ක්ලාන්ත වෙත්, කම්පිත වෙත්, බාලයා පුන පුනා ගැබට පැමිණේ, උපදී, මැරේ, සොහොනට යයි, නුවණැත්තෝ නිවන් ලැබ පුන පුනා නූපදිත්'[31] යැයි ධර්මය අවබෝධ කරදුනි. ධර්ම කරුණු අවසානයේ උදය බමුණා ද තෙරුවන් සරණ ගිය උපාසකයෙක් වූයේය.

මහාසාළ සූත්‍රයේ දී එක්තරා මහලු බමුණෙක් ජරා ජීර්ණ වස්ත්‍රවලින් යුක්තව බුදුන්වහන්සේ කරා එළඹෙයි. ඔහු දුටු බුදුරදුන් කුමන හේතුවක් නිසා මෙසේ වයෝ වෘද්ධව ජරා ජීර්ණ වස්ත්‍රවලින් යුක්ත සිටීදැයි විචාරයි. තමන්ට පුතුන් සිව් දෙනෙක් සිටි බවත් ඔවුන් අඹුවන් සමඟ එක් වී තමා ගෙයින් පිටිවහල් කල බවත් කීය. එවිට බුදුරදුන් දරුවන් සිටින සභාවකට ගොස් කියන ලෙස ගාථා මාලාවක් උගන්වයි. එනම් 'මට දාව උපන් යමෙක් සතුටුවේද යම් කෙනෙකුගේ අභිවෘද්ධිය පැතුයේ ද ඔවුන් අඹුවන් හා එක්ව මා බල්ලෙක්, ඌරෙක්



සේ ගෙවලින් එළවා දැමීය.[32] අසත්පුරුෂ වූ රකුසෝ දරුවන් මෙන් සිට 'පියාණෙනි, පියාණෙනි' කී මුත් වයෝවෘද්ධ වූ කළ එළවා දැමීය. වැඩකට ගත නොහැකි ජරා ජීර්ණ අශ්වයෙක් මෙන් පරිභෝග ධනය නැති බාලයන්ගේ පියා වූ තමාට ආහාර දීමෙන් තොර කරන ලදි. එනිසා අනුන්ගේ ගෙවල සිඟමනේ යමි. එම දරුවන්ට වඩා අද සැරයටියම මට ශ්‍රේෂ්ඨය. එය අඳුරේ යන විට පෙරටුව යයි. ගැඹුරු දියෙන් ගොඩ වීමට පිහිට වෙයි. වැටුණු විට නැවත නැඟී සිටීමට උපකාරී වේ.'[33] යන අර්ථවත් ගාථා පෙළ දරුවන් සහිත සභාවක කීමට සැලැස්වීය. එය ඇසූ දරුවෝ ස්වකීය වයෝවෘද්ධ පියා නිවෙස් කරා ගෙනගොස් නැවත උපස්ථාන කිරීමට පටන් ගත්හ. පසුව බමුණා වස්ත්‍ර යුගලයක් රැගෙන බුදුරදුන් වෙත එළඹ ආචාර්යය ධනය වශයෙන් සළු පිළිගැන්වීමක් ද සිදුකරන අතර අවසානයේ තෙරුවන් සරණ ගිය බෞද්ධ උපාසකයෙක් බවට පත්වෙනුයේ බුදුරදුන්ගේ ප්‍රඥාගෝචර ක්‍රියාවෙහි ප්‍රතිඵලය නිසාවෙනි.

මානයෙන් සිත උඩඟු වූ මානත්ථද්ධ නම් බමුණා මවට, පියාට, ගුරුවරුන්ට හා ජ්‍යෙෂ්ඨ සොහොයුරන්ට ගෞරව කිරීමක් හෝ වැඳීමක් සිදු නොකරයි. මෙකල භාග්‍යවතුන් වහන්සේ විශාල පිරිසකට ධර්ම දේශනා කරන කළ මානත්ථද්ධට මෙබඳු සිතිවිල්ලක් ඇතිවිය. 'මම ශ්‍රමණ ගෞතමයන් කරා යමි, ශ්‍රමණයන් කථා කළොත් පමණක් කථාකරමි. කථා නොකළොත් කථා නොකරන්නෙමි' යනුවෙනි. ඔහු බුදුන් සමීපයට ගියමුත් ඔහු සමඟ කිසිවෙක් කථා නොකළ බැවින් එතැනින් පිටවී යෑමට සූදානම් විය. ඔහුගේ සිතිවිලි දත් බුදුහු ඔහු අමතා මෙහි ප්‍රයෝජනය අපේක්ෂා කරන්නෙකුට මානය වැඩීම සුදුසු නොවේ. යම් ප්‍රයෝජනයක් හේතුකොට ගෙන පැමිණියේ නම් එයම සිදුකරනු මැනවැයි වදාළහ. තමාගේ සිත දැනගත් බැව් අවබෝධ කරගත් මානත්ථද්ධ සිරිපා මත වැඳ වැටී තමා මානත්ථද්ධ නම් බව බැව් පැවසීය. දෙමාපියන්ට, ගුරුවරුන්ට සහ ජ්‍යෙෂ්ඨ සොහොයුරන්ට ගරු නොකරන මොහු බුදු සිරිපා මත වැඳ වැටීම දුටු ජනයා මහත් පුදුමයට පත්විය. අනතුරුව ඔහු තමා කවරෙකුට මානය නොකරන්නේ ද, කවරෙකුට ගෞරව කරන්නේ ද, කවරෙකු පිදිය යුත්තේ ද, කවරෙකු මනාව පිදිය යුත්තේ දැයි විමසීය. බුදුහු දෙමාපියන්ට, ආචාරීන්ට සහ වැඩිමහල් සොහොයුරන් කෙරෙහි මානය ඇති කර නොගත යුතු බවත් නිති ගෞරව කළ යුතු බවත් මනාව පිදිය යුතු බවත් වදාළහ.[34] මෙසේ

කරුණු අවබෝධ කරගත් පසු ඔහු මානයෙන් තොර අයෙක් වී බුදු සසුනෙහි තෙරුවන් සරණ ගිය උවසුවෙක් බවට ද පත්වූයේය.

නව දැව කර්මාන්තයෙහි නියුතු නවකම්මික භාරද්වාජ නම් බමුණා වන ලැහැබක කර්මාන්ත කරන කල බුදුරදුන් සමවත් සුවයෙන් සල් රුකක් මුල වැඩ සිටියහ. උන්වහන්සේ දුටු බමුණා තමා කර්මාන්ත පිණිස වනයෙහි වෙසෙන බවත් ගෞතමයන් කුමක් පිණිස වනයෙහි සිත් අලවා වෙසේදැයි විචාරයි. ඔහුට පිළිතුරු ලබාදෙන බුදුහු තමාට මේ වනෙහි කර්මාන්තයක් නොමැති බවත් තමාගේ කෙලෙස් වනය මුලසුන් කර ඇති බවත් නික්ලේශී තමා පහ වූ රාගාදීයෙහි නො ඇලී වනයෙහි සිත් අලවා සමවත් සුවයෙන් වෙසෙන බව වදාළහ.[35] බුදුන් කෙරෙහි පැහැදුනු බමුණා ද අවසානයෙහි උපාසකයෙක් බවට පත්වූයේය.

දර රැගෙන එන අර්ථයෙන් යුත් කට්ඨාහාර නම් සූත්‍රයෙන් භාරද්වාජගෝත්‍ර බමුණෙකුගේ අතවැසි වූ බොහෝ මානවක පිරිසක් වූහ. ඔවුහු වනයට පිවිසි කල සමවත් සුවයෙන් වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දැක භාරද්වාජගෝත්‍ර බමුණාට ගොස් ඒ බව සැළකළහ. බමුණා බුදුරදුන් හමුවීමට පැමිණ මෙසේ පැවැසීය. ශ්‍රමණයන් ජනයාගෙන් තොර වූ අරණ්‍යයට පිවිස ගැඹුරු වූ බිය උපදවන වනයෙහි නොසැළී මනාව වාසය කෙරේ. යම් තැනක නැටුම් ගැයුම් නොවේ ද එබඳු වනයෙහි සර්වඥයන් ඇසුරු කළේ ද හුදෙකලාව සතුටු සිතින් වෙසේ ද මෙය තමාට මහා පුදුමයකි. ලෝකාධිපති බ්‍රහ්මයා හා සහභාවය පිණිස නිරුත්ත වූ බඹලොව පතමින් වනයෙහි වෙසේ යැයි හඟිමි, නැතහොත් ජනයන්ගෙන් තොර වූ වනයෙහි කුමක් පිණිස ඇසුරු කෙළේ ද බ්‍රහ්මලෝකෝත්පත්තිය පිණිස මෙහි තපස් කෙරේ දැයි විමසීය. එහි දී බමුණාට පිළිතුරු දෙන බුදුහු සිත සතුටු කරන යම් තෘෂ්ණා ක්ලේශයක් වේද අවිද්‍යාව මුල් කොට ඇති අවිද්‍යා මූල සහිත වූ ඒ සියලු තෘෂ්ණාවන් තමා විසින් නසන ලද බවත් බ්‍රාහ්මණ වූ තමාට තෘෂ්ණා නැති බවත් තෘෂ්ණාව ඇසුරු නොකරන බවත් සියලු ධර්මයන්හි විසුද්ධ දර්ශන ඇති අයෙක් බවත් නිරුත්තර වූ ශ්‍රේෂ්ඨ වූ සම්බෝධියට පැමිණ විශාරදව රහසිගතව ධ්‍යාන කෙරෙමියි වදාළහ.[36] බුදුන් වහන්සේ කෙරෙහි සිත් පහදවා ගත් භාරද්වාජ බමුණා තෙරුවන් සරණ ගිය උපාසකයෙක් බවට පත්වීය.

වරෙක භාග්‍යවතුන් වහන්සේට උදරාබාධයක් හටගත් අතර එකල උපස්ථායක වූ උපවාන තෙරුන් අමතා උණුදිය ගෙනවුත්



දෙන්න යැයි ඉල්ලා සිටියහ. තෙරුන් දේවහිත බමුණාගේ නිවෙස වෙත එළඹ නිහඬව සිටගෙන සිටි අතර උන්වහන්සේ දුටු බමුණා කුමක් ඉල්ලා ගැනීම පිණිස පැමිණියේ දැයි විචාළේය. එවිට භාග්‍යවතුන්ගේ අසනීප තත්ත්වය පිණිස උණු දිය සොයා පැමිණි බැව් ප්‍රකාශ කළ විට ඔහු උණුදිය කඳක් ද සකුරු පිඬක් ද සකස්කොට දුන්නේය. තෙරුන් ඒවා රැගෙන ගොස් බුදුරදුන් උණුදියෙන් නහවා උණුදියෙහි සකුරු දියකොට පූජා කළේය. එයින් උදරාබාධය ද සංසිඳුණේය. එහි පැමිණි දේවහිත බමුණා දෙය්‍ය ධර්මය කවරෙකුට දෙන්නේ ද කවරෙකුට දීමෙන් මහත්ඵල වේද? කෙසේ දීමෙන් දක්ෂිණාව සමෘද්ධ වේදැයි විමසීය.[37] එවිට බුදුන්වහන්සේ චතුස්සත්‍ය දැන නිම වූ කිස ඇති උතුම් අර්හත් නමකට දෙය්‍ය ධර්මය දෙන්නේ ද එය මහත් ඵල වන බවත් දක්ෂිණාව සමෘද්ධි වන බවත් වදාළහ.[38] අනතුරුව දේවහිත තෙමේ ද බුදුසසුනෙහි පැහැදී තෙරුවන් සරණ ගිය උවසුවෙක් බවට පත්වීය.

**බ්‍රහ්ම යහජීවනය**

යහපත් සාරධර්ම පද්ධතියකින් ජීවිතය පැවැත්වූ ඇතැම් බ්‍රාහ්මණ පිරිස් ද එකල වූහ. ඒ බැව් මාතුපොසක, භික්ඛක වැනි සූත්‍රවලින් අර්ථවත් වේ. මාතුපොසක බ්‍රාහ්මණයා බුදුරදුන් හමුවීමට ගොස් තමා දැහැමින් භික්ෂාව සොයා දෙමාපියන් පෝෂණය කරන බවත් එය නිවැරදි මාපිය උපස්ථානයක් වේදැයි විමසීය. එසේ දැහැමිව භික්ෂාව සොයා මාපියන් පෝෂණය කෙරේ නම් එයින් බොහෝ පින් රැස්වෙන බවත් එය මනා උපස්ථානයන් බවත් පෙන්වාදුනි.[39] එසේම මාපිය පෝෂණය කිරීම හේතුකොට ගෙන මෙලොව ප්‍රාඥයින්ගේ පැසසුමටත් පරලොව ස්වර්ග සම්ප්‍රාප්තියටත් හේතුවන බව ද පෙන්වාදුන් අතර අවසානයේ මාතුපෝසක බමුණා ද බෞද්ධ උපාසකයෙක් බවට පත්වූයේය.

පිණ්ඩපාත චරණයෙන් ආහාර සපයා ගනිමින් ජීවිතය පැවැත්වූ භික්ඛක නම් බමුණා බුදුරදුන් හමුවට අවුත් තමාත් භික්ෂාවෙන් යුක්ත අයෙක් බවත් භවත් ගෞතමයන් ද භික්ෂාවෙන් යුක්ත අයෙක් බවත් අප දෙදෙනාගේ කිනම් වෙනසක් ඇත්දැයි විචාළේය. භික්ෂණයෙහිත් භික්ෂුත්වයෙත් යථාතත්වය අවබෝධ කරදුන් බුදුරදුන් සිඟීමෙන් පමණක් භික්ෂකයෙක් නොවන බවත්

දුර්ගන්ධ වූ අකුසල ධර්මය සමාදන්ව සිටිනා තාක් කල් භික්ෂු නම් නොවන බවත් සසුනෙහි පින පව බැහැර කොට බඹසර හැසිර නුවණින් දැන ලොව හැසිරේ ද ඔහු ඒකාන්තයෙන් භික්ෂු නම් වන බව වදාළහ.[40] භික්ෂණයෙහිත් භික්ෂුත්වයෙත් තථ්‍ය අර්ථය අවබෝධ කරගත් භික්ඛක අවසානයේ දී උපාසකයෙක් බවට පත්විය.

## සමාලෝචනය

බ්‍රාහ්මණ සමාජයේ පැවැති ආගමික, සාමාජික සහ සංස්කෘතිකමය වශයෙන් විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධව කරුණු රැසක් විවරණය කරන ආකාරය බ්‍රාහ්මණ සංයුක්තයෙන් විද්‍යමාන වේ. බ්‍රාහ්මණිකයන් ස්වාර්ථය උදෙසා පවත්වාගෙන ආ පූජා චාරිත්‍ර රාශියකට අර්ථවත් බවක් ලබාදෙමින් ඒ සියලු නිරර්ථක ක්‍රියා නව මඟකට යොමු කිරීමට බුද්ධ දේශනාවට හැකිවුණි. ඇතැම් බ්‍රාහ්මණ චරණ ධර්මයන් හිංසනයකින් තොර වුවත් අර්ථ විරහිත බැවින් බුදුන් වහන්සේගේ දෝෂදර්ශනයට ලක්ව ප්‍රතික්ෂේප කෙරුණි. අග්නිහෝමය සහ උදකපාරිශුද්ධිය එබඳු අවස්ථා දෙකකි. ඒ සියලුම අනර්ථ ක්‍රියාවලීන්ට නිරවද්‍ය වූ අර්ථවත් මාර්ගයක් පෙන්වා දීම බෞද්ධ දර්ශනයෙහි විශේෂත්වය බව බ්‍රාහ්මණ සංයුක්තයේ විවරිත ධර්ම කරුණු තුළින් පැහැදිලි වේ. බ්‍රාහ්මණ සංයුක්තය වනාහි සමකාලීන බ්‍රාහ්මණ සමාජයේ පැවැති ආගමික පසුබිමත් ඔවුන්ගේ චර්යාධර්ම පද්ධතීන් පිළිබඳවත් පූර්ණ විවරණයක් ඉදිරිපත් කරන්නෙකි.

1 A Handbook of Pali Literature, Oskar Von Hinuber, Walter de Gruyter, Berlin, New York, 1996, P.36

2 Samyuttanikāya aṭṭhakathā I, ed. F.L.Woodward, Pali Text Society, London, 1977, p. 1

3 මජ්ඣිමනිකාය II, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 739 පිටුව.

4 කිංසු ඡත්වා සුඛං සෙති කිංසු ඡත්වා න සොචති,
කිස්සස්ස එකධම්මස්ස වධං රොචෙසි ගොතමාති.
සංයුක්ත නිකාය I (සනි I), බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 286 පිටුව.

5 යථා නාමං තථා චස්ස සියා ඛො ත්වං අහිංසකො
යො ච කායෙන වාචාය මනසා ච න හිංසති
සවෙ අහිංසකො හොති යො පරං න විහිංසති, එම, 294 පිටුව.



6 එම, 288 පිටුව.

7 අක්කෝධස්ස කුතො කොධො දන්තස්ස සමජීවිනො
සම්මදඤ්ඤා විමුත්තස්ස උපසන්තස්ස තාදිනො, එම, 288 පිටුව.

8 තස්ස තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති
කුද්ධං අප්පටිකුජ්ඣන්තො සඞ්ගාමං ජෙති දුජ්ජයං, එම, 290 පිටුව.

9 ජයං වෙ මඤ්ඤති බාලො වාචාය ඵරුසං භණං
ජයං වෙ චස්ස තං හොති යා තිතික්ඛා විජානතො, එම, 292 පිටුව,

10 යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති සුද්ධස්ස පොසස්ස අනඞ්ගනස්ස
තමෙව බාලං පච්චෙති පාපං සුඛුමො රජො පටිවාතං ව ඛිත්තො, එම, 292 පිටුව.

11 න පච්චනීකසාතෙන සුවිජානං සුභාසිතං
උපක්කිලිට්ඨචිත්තෙන සාරම්භබහුලෙන ච, එම, 320 පිටුව.

12 දීඝනිකාය I, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 248-322 පිටු.

13 සනි I, 144 පිටුව.

14 මා ජාති පුච්ඡ චරණඤ්ච පුච්ඡ කට්ඨා හවෙ ජායති ජාතවෙදො
නීචා කුලීනොපි මුනී ධිතීමා ආජානියො හොති හිරීනිසෙධො,
සච්චෙන දන්තො දමසා උපෙතො වෙදන්තගූ වුසිතබ්‍රහ්මචරියො
යඤ්ඤූපනීතො තමුපව්හයෙථ කාලෙන සො ජුහති දක්ඛිණෙය්‍යා, එම, 300 පිටුව.

15 මානො හි තෙ බ්‍රාහ්මණ ඛාරිභාරො කොධො ධූමො භස්මනි මොසවජ්ජං
ජිව්හා සුජා හදයං ජොතිට්ඨානං අත්තා සුදන්තො පුරිසස්ස ජොති, එම, 302 පිටුව.

16 ධම්මො රහදො බ්‍රාහ්මණ සීලතිත්ථො අනාවිලො සබ්භි සතං පසත්ථො
යත්ථ හවෙ වෙදගුනො සිනාතා අනල්ලගත්තා'ව තරන්ති පාරන්ති, එම, 328 පිටුව.

17 න චාහං බ්‍රාහ්මණං බ්‍රෑමි යොනිජං මත්තසම්භවං
භොවාදී නාම සො හොති සවෙ හොති සකිඤ්චනො
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණ, ඛුද්දකනිකාය I, ධම්මපදය, බ්‍රාහ්මණ වග්ගය, බුජත්‍රි. 2006, 14 ගාථාව.

18 අන්තො ජටා බහි ජටා ජටාය ජටිතා පජා
තං තං ගොතම පුච්ඡාමි කො ඉමං විජටයෙ ජටන්ති, එම, 294 පිටුව.

19 සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටං, එම.

20 න බ්‍රාහ්මණො සුජ්ඣති කොචි ලොකෙ සීලවාපි තපොකරං
විජ්ජාචරණසම්පන්නො සො සුජ්ඣති න අඤ්ඤා ඉතරා පජාති, එම, 296 පිටුව.

21 ඛත්තියො බ්‍රාහ්මණො වෙස්සො සුද්දො චණ්ඩාලපුක්කුසො
ආරද්ධවීරියො පහිතත්තො නිච්චං දළ්හපරක්කමො
පප්පොති පරමං සුද්ධිං එවං ජානාහි බ්‍රාහ්මණා, එම, 296 පිටුව.

22 තීහි විජ්ජාහි සම්පන්නො ජාතිමා සුතවා බහු
විජ්ජාචරණසම්පන්නො සො මං භුඤ්ජෙය්‍ය පාසයං, එම, 298 පිටුව.

23 බහුම්පි පලාපං ජප්පං න ජච්චා හොති බ්‍රාහ්මණො
අන්තො කසම්බුසංකිලිට්ඨො කුහනා පරිවාරිතො, එම.

24 එතානි තීහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහ්මණො

විජ්ජාචරණසම්පන්නො සො මං භුඤ්ජෙය්‍ය පායසං, එම.

25 නෙසා සභා යත්ථ න සන්ති සන්තො සන්තො න තෙ යෙ න වදන්ති ධම්මං
රාගඤ්ච දොසඤ්ච පහාය මොහං ධම්මං වදන්තාව භවන්ති සන්තො, එම, 330 පිටුව.

26 එම, 304 පිටුව.

27 එම.

28 සද්ධාබීජං තපොවුට්ඨි පඤ්ඤා මෙ යුගනඞ්ගලං
හිරි ඊසා මනො යොත්තං සති මෙ ඵාලපාචනං, එම, 308 පිටුව.

29 එම.

30 පුනප්පුනං යාචකා යාචයන්ති පුනප්පුනං දානපතී දදන්ති
පුනප්පුනං ඛෙත්තං කසන්ති කස්සකා පුනප්පුනං ධඤ්ඤමුපෙති රට්ඨං, එම, 310 පිටුව.

31 එම, 310 පිටුව.

32 යෙහි ජාතෙහි නන්දිස්සං යෙසඤ්ච භවමිච්ඡිසං
තෙ මං දාරෙහි සම්පුච්ඡ සාව වාරෙන්ති සූකරං, එම, 314 පිටුව.

33 එම, 314 පිටුව.

34 මාතරි පිතරි චාපි අථො ජෙට්ඨම්හි භාතරි
ආචරියෙ චතුත්ථංහි තෙසු න මානං කයිරාථ
තෙසු අස්සු සගාරවො ත්‍යාස්සු අපචිතා අස්සු තෙචස්සු සාධු පූජිතා, එම, 318 පිටුව.

35 න මෙ වනස්මිං කරණීයමත්ථි උච්ඡින්නමූලං මෙ වනං විසූකං
ස්වාහං වනෙ නිබ්බනථො විසල්ලො එකො රමෙ අරතිං විප්පහායාති, එම, 322 පිටුව.

36 ස්වාහං අකඞ්ඛො අසිතො අනූපයො සබ්බෙසු ධම්මෙසු විසුද්ධදස්සනො
පප්පුය්‍ය සම්බොධිමනුත්තරං සිවං ඣායාමහං බ්‍රාහ්මණ රහො විසාරදොති, එම, 324 පිටුව.

37 කත්ථ දජ්ජා දෙය්‍යධම්මං කත්ථ දින්නං මහප්ඵලං
කථං හි යජමානස්ස කත්ථ ඉජ්ඣති දක්ඛිණා, එම, 312 පිටුව.

38 පුබ්බෙනිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි, එම, 312 පිටුව.

39 යො මාතරං වා පිතරං වා මච්චො ධම්මෙන පොසති
තාය තං පාරිචරියාය මාතාපිතුසු පණ්ඩිතො,
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ පමොදතීති, එම, 324 පිටුව.

40 න තෙන භික්ඛකො හොති යාවතා භික්ඛතෙ පරෙ
විස්සං ධම්මං සමාදාය භික්ඛු හොති න තාවතා, එම, 326 පිටුව.